# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු / සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

## ජාත්‍යන්තර අධ්‍යයනය (නව නිර්දේශය)

## ජාත්‍යන්තර නීතිය හා අන්තර්පරායත්තතාවය INTS– E 2025

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "ජාත්‍යන්තර නීතිය, ජාත්‍යන්තර පද්ධතිය හා රාජ්‍යයන් අතර සබඳතා නියාමනය කරයි." උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

02. ජාත්‍යන්තර නීතිය ජාතික නීතියට අදාළ කරගන්නා ආකාර න්‍යායන් සහ උදාහරණ දක්වා පහදන්න.

03. ජාත්‍යන්තර නීති මූලාශ්‍ර දක්වා ඒවායෙහි වැදගත්කම පහදන්න.

04. එක්කෝ

    එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානව හිමිකම් විශ්ව ප්‍රකාශය මානව හිමිකම් සුරැකීමේ ලා සිදුකරන කාර්යභාරය අගයන්න.

    නැත්නම්

    ගෝලීයකරණය ආර්ථික සහයෝගීතාවයට අත්‍යවශ්‍ය වේ. සාකච්ඡා කරන්න.

05. ජාත්‍යන්තර මානුෂීය නීතිය යුධ ගැටුම් පවතින අවස්ථාවන්හි දී රැකවරණය ලබාදෙන අයුරු දක්වන්න.

06. ජාත්‍යන්තර ගැටුම් නිරාකරණ කරන ක්‍රම උදාහරණ සහිතව දක්වන්න.

07. එක්කෝ

    තානාපතිවරයකු සතු කාර්යභාරය, මුක්තීන් හා වරප්‍රසාද තානාපති සබඳතා පිළිබඳ වියානා සම්මුතිය (1961) ආශ්‍රයෙන් දක්වන්න.

    නැත්නම්

    ජාත්‍යන්තර සාගර නීතියට අනුව සාගරය විවිධ විනිශ්චය කලාපවලට බෙදා ඇති අතර එම කලාපයන්හි දී රාජ්‍යයන් ක්‍රියාත්මක විය යුතු ආකාරය දක්වන්න.

08. එක්කෝ

    ඌණ සංවර්ධිත රටවල සුවිශේෂී ලක්ෂණ හඳුනාගෙන ඒවායේ ඌණ සංවර්ධිතභාවයට හේතු පහදන්න.

    නැත්නම්

    ජාත්‍යන්තර පද්ධතිය තුළ භාවිතාවන පිළිගැනීමේ ආකාර විස්තර කර රාජ්‍යයන්, ආණ්ඩු හා රණකාමීන් පිළිගන්නා ආකාරය පහදන්න.

***********************************